// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2460/30 – 2025 ඔක්තෝබර් මස 30 වැනි බ්‍රහස්පතින්දා – 2025.10.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය, කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි.

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, අලව්ව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 966, ඉහළ නුංගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, නුංගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක KU/ALW/2022/2569 හා 2023.12.29 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ - නාරම්පොලවත්ත - ප්‍රමාණය: හෙක්. 1.1389**

උතුරට : ඒ.එම්.සී. උදයබණ්ඩාර සහ තවත් අය හිමිකම් කියන නාරම්පොලවත්ත සහ එම්.ඒ. බණ්ඩාර හිමිකම් කියන ඉන්නාවත්ත; නැගෙනහිරට : ඒ.එම්.එස්. බණ්ඩාර හිමිකම් කියන ඉන්නාවත්ත ඇළ,ඩබ්ලිව්.ඩී.නන්දාවති සහ තවත් අය, ඩබ්ලිව්. ඩී.ඒ. නිලංගන් හිමිකම් කියන ඉන්නාවත්ත ; දකුණට : ඩබ්ලිව්. ඩී.ඒ. නිලංගන් හිමිකම් කියන ඉන්නාවත්ත සහ දෙහෙල්ගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය ; බටහිරට : පහළ නුංගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය.

02. **කැබලි අක්ෂර ‘B’ - නාරම්පොලවත්ත - ප්‍රමාණය: හෙක්. 0.1755**

උතුරට : කේ.කේ. ලීලාවතී හිමිකම් කියන වාගොල්ලවත්ත; නැගෙනහිරට : මාර්ගය (ප්‍රාදේශීය සභා) ; දකුණට :ඩබ්ලිව්.ඩී. සීලවතී හිමිකම් කියන පිනාගේහේන සහ දෙහෙල්ගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය ; බටහිරට : දෙහෙල්ගමුව ග්‍රාම නිලධාරි කොට්ඨාසය.

**කේ. ඩී. ලාල් කාන්ත,**
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2018/PI/186.
2025 අගෝස්තු මස 26 වැනි දින,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 05 – 0282

1A – G 045680 – 09 (2025/10)    ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*